**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2018**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනටමූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍යප්‍රකාශනශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයේ වගකීම

-----------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවටසාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේකාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේපාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබ අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිත අංක 07 හි 14 ඡේදය ප්‍රකාරව පසුගිය වර්ෂයේ නිමකර භාවිතා කරනු ලබන පිරිවැය රු.23,939,251 ක් වූ ගොඩනැගිලි ප්‍රාග්ධනිත නොකර නොනිම් වැඩ ගිණුමෙහි පෙන්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ අතර මණ්ඩලයේ ක්ෂය ප්‍රතිපත්තියට අනුව එම වත්කම් වලට අදාළව රු.1,242,124 ක් ක්ෂය වියදමද මූල්‍ය ප්‍රකාශන වල ගලපා නොතිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිකිරීම් වලට අදාල වැඩ නිමකර තිබුණද වැඩ නිමකිරීමේ තාක්ෂණික වාර්තා ඉදිරිපත් නොකර තිබීම, අත්තිකාරම් පියවීමට අදාල බිල්පත් ඉදිරිපත් නොකිරීම සහ අවසන් බිල්පත් සකස් කර මූල්‍ය අංශය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම නිසා අදාල වටිනාකම් නොනිම් වැඩ ගිණුමේ පෙන්වා ඇත.<br>ගිණුම් අතර සිදුවන ක්‍රියාවලින් සඳහා නිසි පරිදි ගණුදෙනු සිදු නොවීම හේතුවෙන් ක්ෂය ගැලපීමක් 2018.12.31දිනට සිදුකර නැත. | ප්‍රමිතිය ප්‍රකාරව ඒවා ඉදිකිරීම් කටයුතු අවසන් කර භාවිතයට ගන්නා බැවින් කඩිනමින් අදාල වාර්තා ලබා ගෙන එම වත්කම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කල යුතු අතර එමෙන්ම එම වත්කම් වලට අදාල ක්ෂය වීම්ද නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ආ) ප්‍රමිත අංක18 හි 16 ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් මුල්වරට හඳුනා ගැනීමේදී සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කළ අගයට හඳුනාගත යුතු වුවත් ජීව විද්‍යාත්මක වත්කම් ලෙස රු. 28,545,410 ක් පිරිවැයට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන් 12 ඇතුලත එළගව හා මීගව පාලනය, එළු පාලනය සහ බැටළු පාලනය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි.<br>2018.12.31දිනට මෙම සත්ත්ව තොග සාධාරණ වටිනාකම සහ විකුණුම් මිල යන අගයන් දෙකෙන් අඩු අගයට අගය කර ඇත. නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කළ අගයට තොග අගය කර නැත .ඉදිරි වර්ෂයේ දී නිවැරදි තොග අගය කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩුකර ජීව විද්‍යාත්මක වත්කම් මුල් වරට අගය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රමිත අංක 19 ප්‍රකාරව සේවක ප්‍රතිලාභ පාරිතෝෂික ගණනය කිරීම සඳහා ආයු ගණක තක්සේරු කිරීමේ ක්‍රමය (Actuarial Valuation Method) කාලානුරූපීව සිදු කළ යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට වූ පාරිතෝෂික වෙන් කිරීම එවැනි ආයු ගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව රු.125,707,535 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයේ සේවක ප්‍රතිලාභ පාරිතෝෂිත ගණනය කිරීම මෙතෙක් පැවත ආ ආකාරයටම 2018.12.31දිනට ද අගය කර ඇත.ශ්‍රී ලංකාරාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 පරිදි සේවක පාරිතෝෂිත ගණනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරි වර්ෂයේ දී සිදු කරනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව ආයු ගණන තක්සේරු කිරීමේ ක්‍රමය පදනම් කරගෙන සේවක පාරිතෝෂිත වෙන්කිරීම් ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ සේවකයන් 08 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික වෙන්කිරීම රු.919,002 ක් සිදු නොකිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වා තිබුණි. | 2018.12.31 දිනට ආදර්ශ පොල් උයන්වල පාරිතෝෂිත වෙන් කිරීමේලේඛනය පිළියෙල කිරීමේ දී වෙන් කළ යුතු පාරිතෝෂිත වටිනාකම කිසියම් ප්‍රමාද දෝෂයක් නිසා එම ලේඛනයට ඇතුලත් වී නැත .ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය රු 919,002.කින් අඩු වී ඇත .එම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | පාරිතෝෂිත වෙන්කිරීමේදී එය නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ආ) තොග සමීක්ෂණය අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ පොලිබෑග් තොගයෙහි වටිනාකම රු.15,009,488 ක් වුවද එම වටිනාකම රු.13,799,888 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වීම නිසා වර්ෂයේ ලාභය රු.1,209,600 කින් අඩුවෙන්දක්වා තිබුණි. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | තොග අගය කිරීම නිවැරදි ලෙස ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඇ) මුදල්මය නොවන වෙනස්වීම් යටතේපොළී අදායම් වැඩියෙන් ගැලපීම, බදු වෙන්කිරීම් හා ගෙවන ලද බදු නිවැරදිව ගලපා නොතිබීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.මිලියන 12.2 ක් අඩුවෙන් ද කාරක ප්‍රාග්ධනවෙනස්වීම් නිවැරදි ලෙස ගලපා නොතිබීම නිසා එමගින් ජනිත වන ශුද්ධ මුදල් ප්‍රවාහය රු.මිලියන 39.2 ක් වැඩියෙන්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල්මය නොවන වෙනස්වීම් යටතේ ගැලපිය යුතු පොලී ආදායම් රු 1,369.060ක් බදු වෙන්කිරීම් රු.34,216,849 ක් සහ ගෙවන ලද බදු රු.8,507,424 ක් ලෙස සටහන් විය යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඊට අදාල වෙනත් අගයක් ගලපා තිබීම නිසා සිදු වී ඇති වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් යටතේ ණයගැති වැඩිවීම සහ ණයහිමි වැඩිවීම | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී එය නිවැරදි ලෙස පිළියෙල කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| එමනිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිතාවය පිළිබද විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය. | පිළිවෙලින් රු.15,513,746 ක් සහ රු.38,695,432 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඊට අදාල වෙනත් අගයන් දැක්වීම ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ණයගැතියෝ | 161,268,836 | ශේෂ සනාථන ලිපි | වාර්ෂිකව ණයහිමි, ණයගැති ශේෂ සනාථ කිරීමේ ලිපි අදාල අංශ වෙත යොමු කරනු ලැබුවද 2018වසරේ විෂය භාර කටයුතු කල කළමනාකරණ සහකාරවරිය ප්‍රසූත නිවාඩු ලබාගෙන තිබූ බැවින් එම කටයුතු කිරීම මගහැරී ඇත. ඉදිරි වර්ෂයේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ශේෂ සනාථ කිරීම් සෘජුවම විගණනය වෙත ලබාදෙන ලෙස අදාල පාර්ෂවයන් දැනුවත් කල යුතුය. |
| ණයහිමියෝ | 299,633,612 | | | |

## 1.6 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආදර්ශ පොල් උයන් වලින් ලැබිය යුතු රු.2,308,029 ක් ද, තවාන් වලින් ලැබිය යුතු රු.4,596,475 ක් ද වසර5කට අධික කාලයක් ගත වී ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ සිට මාතලේ හා යාපනය ප්‍රාදේශීය කාර්යාලවලින් දිවි නැගුම ජාතික වැඩ සටහන් වෙනුවෙන් ලබා දී තිබූ පොල් පැල සඳහා පිළිවෙලින් රු 150,500 .ක් හා රු 4,445,975 . ක් මණ්ඩලය වෙත ලැබිය යුතු නමුත් දිවිනැගුම ව්‍යාපෘතිය 2015 බලයට පත්වූ රජයේ සිදු වූ වෙනස් වීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් මුදල් අයකර ගැනීමට නොහැකි විය .මෙම වටිනාකම් අමාත්‍යාංශයේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඉදිරියේ දී කපා හැරීමට කටයුතු කරනු ඇත. | දිගු කාලයක් තිස්සේ පවතින ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළමනාකරණය විසින් ක්‍රියාත්මකකළ යුතුය. |
| (ආ) ග්ලිරිසිඩියා ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු රු.2,742,150 ක් සහ වැවිලි කරුවන්ගේ සමූපකාරසමිතිය සඳහා ගෙවිය යුතු රු. 900,000 ක මුදලක් වසර 5 කට | පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශපොල් උයන්වල ක්‍රියාත්මක කරන ලද ග්ලිරිසීඩියා වගාකිරීමේ ව්‍යාපෘති සඳහා Crystal Lanka (Pvt) Ltd. වෙතින් ලැබුණු රු 2,742,150.ක් එම ව්‍යාපෘතිය අවසන් වන තුරු පොල් වගාකිරීමේ මණ්ලයේ වගකීමක් වන බැවින් | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට අවශ්‍යක්‍රියාමාර්ග ගත යුතු අතර එසේ නොහැකි නම් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| අධිකකාලයක් ගත වීඇතත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ වගකීමක් ලෙස සටහන් කර ඇත .මෙම වැඩ සටහන මේ වන විට අවසන් වී ඇති අතර මෙම ශේෂයන් ආදයමක් ලෙස සලකා ඉදිරි වර්ෂයේ දී සටහන් කිරීමට කටයුතු කරනු ඇත එසේම වැව්ලිකරුවන්ගේ සමූපකාර සංගමයෙන් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබා දී ඇති රු 900,000.ක වටිනාකම ද ඉදිරි වර්ෂයේ දී ආදායමක් ලෙස සලකා සලකා ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 සහ 571 | වසර 05 කට වැඩි රු.110,500 ක් වූ ටෙන්ඩර් තැම්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර 5කට වැඩි රු 110,500. ක් වූ ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් සොයා බලා ඉදිරි වර්ෂයේදී ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ඇත. | දිගුකාලීනව පවතින ටෙන්ඩර් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.14,885,097 ක අතිරික්තයක්වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවයරු. 20,936,962 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.35,822,059ක වර්ධනයක්නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේප්‍රාග්ධන සහ පුනරාවර්තනප්‍රදාන වැඩිවීම සහ සංවර්ධන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා රු.56,115,671 ක පිරිවැයට තවත් අතිරේක කොටසක් ඉදිකිරීම් කටයුතු 2014 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර මෙමඉදිකිරීම සඳහාකොන්ත්‍රාත්කරු සමහගිවිසුමට එළඹීමට | 2014 වර්ෂයේ ප්‍රතිපාදන අවශ්‍ය පරිදි ඉල්ලුම් කළ ද භාණ්ඩාගාරයේ වෙන් කිරීම් අනුව මණ්ඩලයට වෙන් කිරීමට හැකි වුයේ රුපියල් 7,000,000ක මුදලක් පමණක් බැවින් අදාල කාර්යය ආරම්භ නොවී 2015 . වර්ෂයේ ද ඇස්තමේන්තුවේ මේ සඳහා රුපියල් 6,881,850.00ක මුදලක් වෙන් වී තිබුණ බැවින් ,ප්‍රසම්පාදන කාර්යයන් | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම අදාල ආයතන වලින් ලබාගත යුතු අනුමැතින් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රථමගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්ම සඳහාඅදාළ ආයතනවලින් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මෙම ඉදිකිරීම සඳහාමේ දක්වා රු.14,388,275 ක මුදලක්වැය කර තිබුණද,අනුමැතිය ලබා ගැනීම සඳහා වසරකට ආසන්න කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු මුලදී එකඟ වූ මිලට ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි බැවින් ඉදිකිරීම් කටයුතු සිදු නොකර කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි. | ආරම්භ කරනු ලැබිණි .මෙම ඉදිකිරීම් සඳහා වූ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ගොඩනැගිලි අනුමැතිය ලබා ගැනීම ප්‍රමාදවීම මත කොන්ත්‍රාත්කරු සමඟ 2018.01.16දින නැවත වරක් ගිවිසුමට එළඹීමට පොල් වගාකිරීමේ මණ්ඩලයට සිදු විය .<br>ඒ අනුව නැවත ඉදිරිපස කාර්යය පමණක් කොන්ත්‍රාත්කරු විසින් ආරම්භ කරන ලදී.<br>නමුත් සමස්ථ ඉදිකිරීමේ ප්‍රගතියක් සිදු නොවූ බැවින් සාකච්ඡාවක් කැඳවීමට පොල් වගාකිරීමේ මණ්ඩලය තීරණය කරන ලදි .එ අනුව දැනට සිදු කරමින් පවතින ඉදිරිපස කොටසේ වැඩ නිම කිරීම සඳහා මාස තුනක කාලයක් අවශ්‍ය බව 2019.07.17දිනැති කොන්ත්‍රාත්කරු ගේ ලිපිය මඟින් දන්වා එවන ලදි. | |
| (ආ) | කතරගම සංචාරක නිල නිවාසයේ ඉදිකිරීමට අදාලව කොන්ත්‍රාත්කරුගේ රඳවුම් මුදල අඩුපාඩු දැනුම්දීමේ කාලය අවසානයේ කොන්ත්‍රාත් උපදේශකගේ නිර්දේශය මත නිදහස් කළ යුතුව තිබුණද මණ්ඩලය විසින් උපදේශකගේ නිර්දේශයෙන් තොරව අඩුපාඩු දැනුම්දීමේ කාලය අවසන් වීමට ප්‍රථම සියයට 75 ක් එනම් රු.562,808 ක මුදලක් නිදහස් කර තිබුණි.මේ හේතුවෙන් හඳුනාගන්නා ලද ඉදිකිරීම් අඩුපාඩු කොන්ත්‍රාත්කරු විසින් සිදු නොකිරීම නිසා එම මුදලඅයකර ගැනීමට රඳවුම් මුදල ප්‍රමාණවත් වීනොතිබුණි. | මේ වන විට පෙන්වා දෙන ලද අඩුපාඩු ලැයිස්තුව සැදීමෙන් පසුව රඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව කොන්ත්‍රාත්කරු වෙත අංක E/7/CONS/RENO/KATHARA දරණ 2019.03.25දිනැති ලිපිය මඟින් දන්වා ඇත . නමුත් මේ වන තෙක් කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදු නොවුන හෙයින් මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් පිළිබඳව සාකච්ඡා කර ඉදිරියෙදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවුම් මුදල් නිදහස් කිරීමේදී අදාල උපදේශකගේ නිර්දේශය මත නිදහස් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | පිරිවිතරයන්ට අනුකූල නොවූ පොලිබෑග් 2017 වර්ෂයේ සහ 2018වර්ෂ වලදී පිළිවෙලින් 450,000 ක් හා 200,000 ක් මිල දී ගෙන තිබුණු අතර මෙම පොලිතින් බෑග් ගබඩාවෙන් ඉවත් කිරීමට කළමනාකරණය කටයුතු නොකිරීම හේතුවෙන් අලුතින් මිලදී ගන්නා පොලිබෑග් ආරක්ෂිතව ඇසිරීමට ගබඩා පහසුකම් නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. | පොලි බෑග් 450,000 ක ප්‍රමාණය පොලි බෑග් 02ක බැගින් එක් කර බඳුන් ගත පොල් පැල නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට දෙපාර්තමේන්තු මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටුව තිරණය කිරීමත් සමඟ එම පොලි බෑග් තොගය මේ වන විට බඳුන් ගත පොල් පැල නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට කටයුතු කර ඇත.<br>ගබඩා තුල පවතින පොලි බෑග් 200,000ක ප්‍රමාණය ඉවත් කර ගන්නා මෙන් අදාල ආයතනයට කිහිප අවස්ථාවක දැනුම් දී ඇත . | අලුතින් පොලි බෑග් මිලදී ගැනීමට ප්‍රථම පිරිවිතරයන්ට අනුකූල නොවූ පොලි බෑග් ගබඩාවෙන් ඉවත් කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මාහයාය ආදර්ශ පොල් උයනෙහි පවතින තේක්ක ගස්25 ක් අලෙවි කිරීම සඳහා දෙවරක් මිල ගණන් කැඳවා තිබුණ අතර, එහිදී පළමුවර ලංසු කැඳවීමේදි සුදුසු ගැනුම්කරුවෙකු තෝරා ගැනීමට අවස්ථාව තිබියදී නැවත මිල කැඳවීමක් සිදුකර තිබුණි. නමුත් දෙවනවර මිල ගණන් කැඳවීමෙන් තෝරා ගන්නා ලද ගැනුම්කරු පසුව මෙම තේක්ක ගස් මිලදී ගැනීමට ඉදිරිපත් වී නොමැති අතර මේ සඳහා දරන ලද රු.172,120 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. මෙම කාර්ය ආරම්භ කර වර්ෂ 2 ක කාලයක් ගතවී තිබුණද මෙම තේක්ක ගස් අලෙවි කර ගැනීමට අපොහොසත් වී තිබුණ නිසා මණ්ඩලයට ලැබිය යුතු රු.4,100,000 ක ආදායම අහිමි වී තිබුණි. | නැවත තේක්ක ගස් අලෙවි කිරිම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරිමට තක්සේරු වාර්තා ලබා ගැනිමට කටයුතු කරමින් පවතින අතර ,අදාල කාර්යයනිම වීමෙන් පසු විධිමත් පරිදි ප්‍රසම්පාදන කටයුතු කඩිනමින් සිදු කරන බව කාරුණිකව සඳහන් කරමි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු විධිමත් පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකර මෙම තේක්ක ගස් කඩිනමින් අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය මඟින් මයිටා පැකට් 54,000 ක් වගාකරුවන් වෙත බෙදාදීමට 2018 වර්ෂයේ ඉලක්ක ගත කර තිබුණද, අවශ්‍ය මයිටා පැකට් ප්‍රමාණය ගෙන්වා බෙදාහැරීමට කටයුතු නොකිරීම නිසා වගාකරුවන් වෙත ලබාදී තිබුණේ මයිටා පැකට් 9,950 කි. එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 18.42 කි.එබැවින් එය එම ප්‍රදේශයේ පොල් ඵලදාව අඩු වීමට බලපා තිබුණි. | නව විලෝපික මයිටා නිෂ්පාදනාගාරයක් ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාපිත කරන ලද්දේ 2018 වර්ෂයේ අග භාගයේ දීය. එහිදි වර්ෂයේ මුළු ඉලක්කයම ප්‍රමාණවත් ලෙස විලෝපික මයිටාවන් සපයා ගැනිමට නොහැකි තත්ත්වයක් ඇති විය. ඒ හේතුවෙන් 2018 වර්ෂයේ ඉලක්කය ප්‍රමාණවත් ලෙස සපුරාගත නොහැකි විය. 2019 වර්ෂයේ මේ වනවිටත් දී ඇති ඉලක්කයට අනුව විලෝපික මයිටා පැකට්වල 90% ක සාර්ථක ප්‍රගතියක් ලබා කර ගෙන ඇත. | ප්‍රදේශයේ පවතින මයිටා මැඩ පැවැත්වීම සඳහා වගාකරුවන් වෙත අවශ්‍ය මයිටා පැකට් බෙදාහැරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කරක්‍රියාත්මක කිරීමට කළමනාකරණ කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2018 වර්ෂයේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයේ පොල් වගාවට සහ අතුරු භෝග වලට අදාළව ඉලක්කගත සහනාධාර ගෙවීම රු.15,175,000 ක් වුවත්, එම සහනාධාරවලින් 2017 වර්ෂයට අදාළ හිඟ සහනාධාර ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සහනාධාර වශයෙන් පොල් වගාකරුවන් වෙත ලබා දී ඇත්තේ රු.7,244,978 ක් පමණි. ඒ අනුව 2018 වර්ෂය වෙනුවෙන් රු.7,930,022 ක හිඟ | 2017 වර්ෂයේ හිඟ මුදල සඳහා වෙනම ප්‍රතිපාදන නොලැබුණ හෙයින් 2018 වර්ෂයේ ප්‍රතිපාදනවලින් 2017 වර්ෂයේ හිඟ සහනාධාර මුදල් ගෙවන ලදී. ඒ අනුව 2018 වර්ෂයට අදාලව සහනාධාර ගෙවීමට හිඟ ප්‍රතිපාදන හිඟයක් ඇති විය. තවද 2018 වර්ෂයට අනුමත වූ රු.මිලි. 810 ක ප්‍රතිපාදන පිළිබඳව රු.මිලි. 694 ක් පමණක් ලැබීම මෙම තත්ත්වය තවදුරටත් උග්‍රවීමට බලපාන ලදි. | වගාකරුවන් විසින් තම ඉඩම් වල කරනු ලබන වගා කටයුතු වලට අදාල සහනාධාර මුදල් කඩිනමින් වගාකරුවන් වෙත ලබාදීමට කළමණාකරණය කටයුතු කල යුතුය. |

සහනාධාරයක් ගෙවීමට සිදු වී තිබුණි. එම නිසා සිය වගා කටයුතු සඳහා අවශ්‍ය සහනාධාර නිසි කලට නොලැබීම හේතුවෙන් පොල්වගාව සම්බන්ධව ගොවීන්ගේ උනන්දුව අඩුවීමට හේතුවී තිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය කලමනාකරණ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්තිහාසංවර්ධන) යන තනතුරු පිළිවෙලින් අවුරුදු02 මාස 09 ක් හා අවුරුදු 01 මාස 11 කට වඩා වැඩි කාලයක් පුරප්පාඩු වී තිබුණ අතර එම තනතුරු සඳහා සථිර නිලධාරීන් පත්කරගැනීමට කටයුතු නොකිරීම නිසා අදාල තනතුරු වල කාර්යභාරයන් කාර්යක්ෂම ලෙස ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | පොල් වගා කිරීමේ මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමණාකරණ) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන) යන තනතුරු වල පිළිවෙලින් අවුරුදු 02 මාස 09 ක් හා අවු 01 මාස 11 කට වැඩි කාලයක් පුරප්පාඩු පැවතුනද ,එහි රාජකාරි කටයුතු සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමණාකරණ) හා සහකාර සාමාන්‍යාධිකාරි (ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන) විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වැඩ බලන තනතුරු වල රාජකාරි කටයුතු නොඅඩුව හා නොපිරිහෙලා ඉටු කර ඇත. | මණ්ඩලයේ පවතින ප්‍රධාන තනතුරු සඳහා ස්ථිර නිලධාරින් කඩිනමින් බඳවා ගැනිම සඳහා අවශ්‍යක්‍රියාමාර්ග කළමනාකරණය විසින් ගත යුතුය. |